# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/LH/09/ගෙවතු-2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2022.01.12 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් ඇතුළු සියලු නිලධාරීන් වෙත,

**සෞභාග්‍යා ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන - 2022**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2022.01.10 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2022.01.11 දින අරලියගහ මන්දිරයේදී ගරු මුදල් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී තෝරා ගනු ලබන ගෙවතු වල භූමි ප්‍රමාණය අනුව ලබාදෙනු ලබන මුදල් ප්‍රමාණය වෙනස් නොවිය යුතු බවට උපදෙස් ලබාදුනි. ඒ අනුව මාගේ සමාංක හා 2022.01.10 දිනැති ලිපියේ 04 වන ඡේදයේ සඳහන් "පර්චස් 20 ට අඩු ගෙවතු සඳහා රු. 5,000.00 ක මුදලක් ලබාදෙන අතර බිම් සැකසීම ආදී මූලික කටයුතු සඳහා රු.1,500.00 ක අත්තිකාරමක් ලබාදෙන අතර පර්චස් 20 ට වැඩි ගෙවතු සඳහා රු. 10,000.00 ක් වන අතර මෙහිදී අත්තිකාරම් මුදල රු. 3,000.00 ක් වේ" යන්න " ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගන්නා ලද කාණ්ඩ 03 යටතේ තිබෙන සියළුම ගෙවතු සඳහා උක්ත වැඩසටහන යටතේ රු. 5,000/- ක මුදලක් ලබාදෙන අතර අත්තිකාරම් මුදල රු. 1,500/- ක් වේ "ලෙස සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

03. එම ලිපියේ 05 වන ඡේදයේ සඳහන් පරිදි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙවතු හිමියන් සඳහා පැල ලබාදීමට සෑම වසමකින්ම එක් පැල තවාන්කරුවෙකු හඳුනාගත යුතු අතර හඳුනාගත් පැල තවාන් හිමියන්ගේ තොරතුරු පහත උපදෙස් අනුගමනය කරමින් CRM මොඩියුලයට ඇතුලත් කරන මෙන් කාරුණිකව දන්වමි.

- crm.esamurdhi.gov.lk යන වෙබ් ලිපිනය හෝ අපගේ නිල වෙබ් අඩවියේ ඇති crm login තුලින් CRM මොඩියුලයට ඇතුලත්වී ග්‍රාම නිලධාරී වසම් හෝ සමෘද්ධි බැංකුවේ user භාවිතා කරමින් Project Application 2021 තුලට පිවිස Add බටනයෙන් පැල තවාන්කරුගේ තොරතුරු ඇතුලත් කරනු ලබන form එකට ඇතුලත් විය යුතුය.
- එම පෝරමය තුල ඇති පැල තවාන්කරුගේ පුද්ගලික තොරතුරු සම්පූර්ණ කර Project Category තුලින් Home Garden Programme 2022 තෝරාගන්න.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2** |

- එලෙස තෝරාගත්විට Category of Project That are expected to be implemented තුල Agriculture යටතේ "Plant Nursery Owner / පැල තවාන් කරු"යන්න දිස්වේ.
- මෙම පෝරමය තුල අවශ්‍ය තොරතුරු පමණක් සම්පූර්ණ කර (ව්‍යාපෘති කරනු ලබන ආයෝජන යන්න අවශ්‍ය නොවේ) Submit කිරීම තුලින් පැල තවාන්කරුගේ තොරතුරු CRM පද්ධතියට ඇතුලත් කල හැකිය.
- ප්‍රායෝගික ගැටළු මත සෑම ග්‍රාම නිලධාරී වසමකින්ම එක් තවාන්කරුවෙකු බැගින් තෝරාගත නොහැකි අවස්ථාවකදී පමණක් එක් තවාන්කරුවෙකුට වසම් කිහිපයකට පැල ලබාදිය හැකි අතර එහිදී ඒ ඒ වසම යටතේ තවාන්කරුගේ නම ඇතුලත් කළ යුතුය.
- ඇතුලත් කර ඇති තොරතුරු Reports තුල ඇති Project Application Detail Report තුලින් බලා ගත හැකිය.
- හඳුනාගත් තවාන් හිමියන්ගේ තොරතුරු CRM මොඩියුලයට ඇතුලත් කර එම තොරතුරු 2022.01.21 දිනට පෙර CRM මොඩියුලය තුළින් අප වෙත ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

04.ඉහත පැල තවාන්කරුවන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය යටතේ ලියාපදිංචි කිරීම, බීජ පනතට අනුව අනිවාර්යය කරුණකි. එබැවින් හඳුනාගනු ලැබූ පැල තවාන්කරුවන් බීජ සහතික කිරීමේ දිස්ත්‍රික්ක කාර්යාල වල තනි පුද්ගල වශයෙන් හෝ පුද්ගල කණ්ඩායම් ලෙස ලියාපදිංචි කිරීමේ හැකියාව පවතී. එබැවින් ඔවුන් කණ්ඩායම් ලියාපදිංචිය යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නේ නම් මැනවි. අදාල දිස්ත්‍රික් කාර්යාල වල ලේඛණය හා ලියාපදිංචි කිරීමට අදාල අයදුම් පත්‍රය මේ සමඟඅමුණා ඇත.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු කාර්යය මණ්ඩලයෙන් ලැබෙන සහාය අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:- 1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යයසාධන බලකාය - කා.දැ.ගැ.පි.

D/Live/Se/Sawb.01.10